# HUGO BOSS සමාජ ප්‍රමිතීන් මට්ටම්

1. **හැඳින්වීම**

සමාජ මට්ටම් යනු HUGO BOSS සැපයුම්කරුවන්ගේ සේවකයින් සඳහා වූ මූලික අයිතීන් සහ මූලික පරිසරික ප්‍රමිතීන් ඇතුලත්වේ. HUGO BOSS සියළුම සේවකයින් සඳහා සමාජ ප්‍රමිතීන් අදාලවේ.

සමාජ ප්‍රමිතීන් ජාත්‍යාන්තර කම්කරු සංවිධානයේ (ILO) මෙන්ම මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශයෙහි පොදු සම්මතයන් මත පදනම් වී ඇත. සියළුම සැපයුම් කරුවන් මෙම ප්‍රමිතීන්ට අනුව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. අවශ්‍ය වූ විට සමාජ ප්‍රමිතීන් වෙනස් කිරීමට HUGO BOSS වෙත අයිතියක් ඇත.

සමාජ ප්‍රමිතීන්හි සකසා ඇති අවශ්‍යතා සහ බැඳීම් (ප්‍රමිතීන්) සැපයීමෙහි යෙදී සිටින සියළුම සේවකයින් එනම් ඒ අය සෘජුව වක්‍රව ස්ථිර හෝ නිවාසයන්හි සිට සේවය කරන අය ඇතුළු සියළු දෙනාටම මෙය අදාලවේ.

HUGO BOSS සමාජ ප්‍රමිතීන් සහ ජාත්‍යාන්තර සහ ජාතික නීතියට අනුව සේවකයින්ගේ සේවාස්ථානය තුල ඒ අයගේ අයිතීන් සහ වගකීම් පිළිබඳ ඒ අයට නිසිපරිදි දැනුම් දීම සැපයුම් කරුගේ වගකීම වේ. සමාජ ප්‍රමිතීන් ස්ථාපනය කිරීම පිළිබඳ වගකීම ගැනීම සඳහා සැපයුම් කරු විසින් සමාගම් නියෝජිතයකු පත්කරනු ලබයි. පත්කරන ලද පුද්ගලයාගේ නම HUGO BOSS වෙත යවයි.

මෙම සමාජ ප්‍රමිතීන් සමඟ අනුකූල වීම සඳහා සැපයුම් කරු සිදුකරන ක්‍රියාවන් සාධාරණ ආකාරයට ලේඛනගත කළ යුතුයි.

2. **උපකොන්ත්‍රාත් කරුවන්ගේ ස්ථානවල සමාජ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම**

තවද, සැපයුම් කරු තම උපකොන්ත්‍රාත් කරුවන්ට සහ උප සැපයුම්කරුවන්ට HUGO BOSS සමාජ ප්‍රමිතීන් සමඟ අනුකූල ව සිටීමට සහ අනුකූල වනවාද කියා අධීක්ෂණය කිරීම සහ නිසි HUGO BOSS සමාජ ප්‍රමිතීන් පිළිවෙලකට ක්‍රියාත්මක කිරීම. විශේෂයෙන් මෙම සමාජ ප්‍රමිතීන්ට අනුව විගණනය සිදුකිරීම HUGO BOSS වෙත අවසර ලබාදීමට සැපයුම්කරු තම උප කොන්ත්‍රාත් කරුවන් සහ උප සැපයුම්කරුවන් සමඟ එකඟතාවයකට පැමිණෙයි.

3. **මාර්ගෝපදේශයන්**

3.1 **ජාතික නීති සහ සමාජ ප්‍රමිතීන් සමඟ අනුකූල වීම.**

මෙම සමාජ ප්‍රමිතීන් සමඟ අනුකූලවීමට අමතරව සැපයුම්කරු සදාචාරමය ලෙස ක්‍රියාකිරීම සහ ජාත්‍යාන්තර පොදු සම්මතයන් සමඟ මෙන්ම අදාල දේශීය සහ ජාතික නීති සමඟ අනුකූල වීම විශේෂයෙන් සැපයුම්කරුගේ නිෂ්පාදන මධ්‍යස්ථාන වලට දාල ජාතික කම්කරු සහ සමාජ සුභසාධක නීති සමඟද අනුකූල වීමට බැඳී සිටී.

තවද සැපයුම්කරු අල්ලස් ගැනීම් අයුතු ගණුදෙනු සිදුකිරීම හෝ වෙනත් දූෂණ කටයුතු වල නිරත වීම් සඳහා ඉඩ ලබා නොදීම හෝ අවසර නොදිය යුතුයි. සැපයුම් කරු HUGO BOSS සමඟ ඇති ව්‍යාපාර සබඳතාවයට සම්බන්ධ වූ කාර්යයන් ක්‍රියාවන් හෝ තීරණ ගැනීම් හා සම්බන්ධ කටයුතු වලදී වෙනත් පාර්ශ්වයකට හෝ කිසිදු HUGO BOSS සේවාදායකයකු සමඟ අක්‍රමවත් ලෙස කටයුතු කිරීම සඳහා සෘජුව හෝ වක්‍රව ගෙවීම ලබාදීම පොරොන්දු වීම් සිදු නොකළ යුතුයි. පුද්ගලයකු නීත්‍යානුකූලව අනුමත නොවන ආකාරයට අවිශ්වාසීව කටයුතු සඳුකිරීම.

ඊට අමතරව මෙම සමාජ ප්‍රමිතීන් අවම ප්‍රමිතීන් සකසා ඇත. ජාතික ව්‍යවස්ථාවේ අරමුණු සමාජ ප්‍රමිතීන්හි අන්තර්ගතයන් සමඟ සමපාත වන අවස්ථාවන්හීදී එහි කොන්දේසි මගින් සේවාදායකයන්ට විශාල රැකවරණයක් ලබාදෙයි.

3.2 ළමා කම්කරු සේවය.

සැපයුම්කරු කිසිදු අවස්ථාවක ළමයි සේවයේ නොයොදවයි. සේවයේ යෙදවීම සඳහා අවම වයස අවු 15 වේ. කෙසේ හෝ පාසල් යාම අනිවාර්ය බැවින් එම වයස් සීමාවට වඩා අඩු ළමයි සේවයේ යෙදවීය නොහැකිය. ඊට අමතරව වයස අවු 18 ට අඩු සේවකයින් ලවා අනතුරුදායක වැඩ නොකරවාගැනීමට සැපයුම්කරු වගබලාගත යුතු අතර සහ ඒ අයගේ අධ්‍යාපනයට පුහුණුවට හෝ ඒ අයගේ සෞඛ්‍යයට හෝ ඒ අයගේ ශාරීරික මානසික බුද්ධියට හෝ සමාජ සංවර්ධනයට බාධා වන ආකාරයේ සේවාවන් වල නොයෙදිය යුතුයි.

3.3 බලෙන් වැඩ ගැනීම

කිසිදු පුද්ගලයෙකුගේ කැමැත්තක් නොමැතිව සේවයේ යෙදවිය නොහැකිය. ඊට අමතරව සැපයුම්කරුවන් සේවකයනගෙන් බලෙන් වැඩ ගැනීම සහතික නොලත් සේවකයින් වහලුන් හෝ සිරකරුවන්ගෙන් වැඩ නොකරවාගත යුතුයි. සේවකයින්ට තම සේවා කාල වලදී හෝ සේවා කාලයෙන් පසු නිදහසේ එහේ මෙහේ යාමට බාධා නොකළ යුතුයි.

වෘත්තීය සබඳතාවය පවත්වාගැනීම සඳහා සේවකයින්ගේ පුද්ගලික ලිපිලේඛන තම සැපයුම්කරු ළඟ තැන්පත් කර තැබිය යුතුයි. සැපයුම් කරුවන් තම සේවකයින්ගෙන් සුරක්ෂිත තැන්පතුවක් නොගත යුතුය. සේවකයින්ගේ හඳුනාගැනීමේ ලේඛනද තම භාරයට නොගතයුතුය. සේවකයින්ට පෙර දැනුම් දීමකින් තම වෘත්තීය සබඳතාවය අවසන් ් කළ හැකිවිය යුතුයි.

3.4 මානුෂීය සේවක කොන්දේසි.

සැපයුම් කරුවන් සෑම කෙනෙකුගේම පුද්ගලික අභිමානය පෞද්ගලිකත්වය සහ පෞද්ගලික අයිතීන් කෙරෙහි ගරු කළ යුතුයි. සියළුම ආකාරයේ ශාරීරික මානසික ලිංගික හෝ වාචික හිරිහැර කිරීම් ශාරීරික අපයෝජනයන් මෙන්ම සියළුම ආකාරයේ තර්ජනය කර පොළඹවා ගැනීම් හෝ ශ්‍රම සූරා කෑම් තහනම්ය. විනයානුකූල පියවරයන් ජාතික කම්කරු නීති සහ මානව හිමිකම්හි ජාත්‍යාන්තරව පිළිගත් ප්‍රමිතීන් සමඟ අනුකූල විය යුතුයි.

3.5 වෙන්කොට සැලකීම තහනම් කිරීම

සියළුම සේවකයින්ට තම ජාතිය වර්ණය ලිංගය වයස සමාජ ජනවර්ගය හෝ ජාතික සම්භවය ආගම සේවකියි සංවිධාන සමඟ සම්බන්ධවීම (වෘත්තීය සමිති ඇතුළු) දේශපාලන මත ලිංගික දිශානතිය විවාහක අවිවාහක බව හෝ වෙනත් පුද්ගලික ආපදාවක් ගර්භනී වීම හෝ වෙනත් පුද්ගලික ලක්ෂණ නොසලකා සමාන ලෙස සැලකිය යුතුයි. කුලියට ගැනීමේ ක්‍රියාවලිය විනය, සෙවකයින් විශ්‍රාමයාම සහ සෙවය අත්හිටුවීම වැටුප් ගෙවීම සහ සමාගම් වශ්‍රාම වැටුප් ගෙවීම, සහ සම්ගම් විශ්‍රාම වැටුප් ගෙවීම මෙන්ම උසස්වීම් සම්බන්ධ කටයුතු වලදී යන සෑම ක්‍රියාවකදීම සමානව සැලකීමේ මූලධර්මය අදාල විය යුතුය.

3.6 උපරිම සේවා පැය ගණන සහ අවම වාර්ෂික නිඩාඩු

ජාතික ව්‍යවස්ථාවට අනුව සේවය කිරීමේ පැය ගණන සමග සැපයුම් කරුවන් අනුකූල විය යුතුයි. ජාතික නීතිරීති එවැනි කොන්දේසි ඇතුලත් නොමැති විට හෝ ජාත්‍යාන්තර කම්කරු සංවිධානයේ හර පොදු සම්මුතින් හි අදාල කොන්දේසි වලට වඩා අඩු නීතිරීති ඇති විට සතියකට වැඩ කළ යුතු පැය ගණන පැය 48 ක් වේ. සතියකට වැඩකරන පැය (ස්වේච්ඡා අතිකාල වේලාව ඇතුළු) 60 නොඉක්මවයි. තම සේවකයන්ට නිරත්තරයෙන් අතිකාල සේවය යොදවන ලෙස සේවායෝජකයින් නොපැවසිය යුතුයි. අතිකාල. සේවකයා ස්වේච්චාවෙන් ඉදිරිපත් වුවහොත් හෝ අදාල සාමුහික එකඟතාවයකට පැමිණ අතිකාල සේවයේ යෙදීමට කැමැත්තෙන් ඉදිරිපත් වුවහොත් හැර අතිකාල සේවය අනිවාර්ය කළ නොහැක.

සේවකයකු එක දිගට දවස් 6ක් වැඩ කිරීමෙන් පසු එක් දිනක් (පැය 24) නිවාඩුවක් හිමිවේ. ඊට අමතරව සෑම සේවකයකුම ව්‍යවස්ථානුකූලව ලැබිය යුතු අවම නිවාඩු වලට හිමිකමක් ලබයි.

3.7 වනිදි ලැබීම්

සැපයුම් කරු තම සේවකයින්ගේ කැමැත්ත පරිදි ඒ අයගේ සේවාව වෙනුවෙන් මුදල් වලින් හෝ ඒ අයගේ කැමැත්ත පරිදි වන්දි ලබාදිය යුතුයි. සේවකයකුගේ මූලික අවශ්‍යතා සපුරාලීම හෝ කැමැත්ත පරිදි අදායමක් ලබාදීම වෙනුවෙන් සෑම සේවකයකුගේම අඛණ්ඩ වැඩ නීතියක් සඳහා වන්දි ලැබීමේ අයිතියක් තිබේ. නීතියට හෝ ගිවිසුමට අදාලව සියළුම නීති අවශ්‍යතා සමඟ අනුකූල වන අවම වේතන හෝ ගැලපෙන පවතින වේතනය මේ දෙකෙන් වැඩ වේතනය සේවකයකුට ගෙවන ලබයි. මෙම අවශ්‍යතා සපුරාලන්නේ නොමැති විම සැපයුම්කරු HUGO BOSS සමඟ එකඟ වී ප්‍රමාණවත් වන්දි මුදලක් තීරණය කරගත යුතුයි. වැටුප් සහ වේතන මසකට වතාවක්වත් ගෙවිය යුතුයි. වෘත්තිය සම්බන්ධතාවය ඇතිකරගැනීමට පෙර සේවකින්ට අත්සන් කරනලද ලිඛිත ගිවිසුමක් ලබාදිය යුතුයි වන්දි ගෙවීම වෘත්තිය ගිවිසුමේ පූර්ණ අංගයක් විය යුතුයි. වැටුප් ලේඛනයේ තොරතුරු සේවකයින්ට ලිඛිතව ලබාදිය යුතුයි.

සෑම අතිකාල සේවයක් සඳහා වන්දි මුදල සාමාන්‍ය මිලට වැඩි මිලක් ලබාදිය යුතුයි. අවශ්‍ය අවස්ථාවලදී ව්‍යවස්ථානුකූල අවශ්‍යතා හෝ සමූහ ගිවිසුම් එකඟතා අදාල විය යුතුයි ව්‍යවස්ථානුකූල නීති මගින් සේවකයින්ට අතිකාල සේවය සඳහා වන්දි ගෙවීමේදී මෙය සේවකයාගේ එකඟතාවය මත සිදුවිය යුතුයි.

කම්කරු විනය පවත්වාගැනීම සඳහා සැපයුම්කරු මූල්‍යමය දඩ වනිද,හෝ සේවකයාගේ වේතනයෙන් අඩු කිරීම් සිදු නොකල යුතුයි. දෙශීය නීතියෙන් අනුමත ප්‍රමාණයට පමණක් අඩුකිරීම් සිදුකළ යුතුයි. ගන්නාලද ක්‍රියාමාර්ග විනිවිද භාවයෙන් ලේඛනගත කර සේවකයාගේ කැමැත්ත පරිදි සිදුවිය යුතුයි.

3.8 සෞඛ්‍ය සහ ආරක්ෂාව

සැපයුම්කරු තම සේවකයන්ගේ සේවා කාලය තුලදී සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ වගකිව යුතුයි. සැපයුම්කරු ඒ අයට ආරක්ෂිත සහ සනීපාරක්ෂක සේවා පරිසරයක් ලබාදී හැකිතාක් දුරට අනතුරු සහ වෘත්තීය ලෙඩරෝග සිදු නොවන ලෙසට වග බලා ගතයුතුයි. විශේෂයෙන් සැපයුම්කරු තම සෙවකයින් සඳහා නිරන්තර සෞඛ්‍ය සහ ආරක්ෂක පුහුණුවීම් ලබාදිය යුතුයි.

ප්‍රධානව අවධානය යොමුකළ යුත්තේ ගින්දර ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ සහ රසායනික ආරක්ෂාව සඳහායි. හදිසි මාර්ග, සහ ආරක්ෂිත පිටවුම් මාර්ග පැහැදිළි ලෙස සළකුණු කොට ආලෝකමක් කර බාධාවකින් තොරව තැබිය යුතුයි. දේශිය නීතිරීති අනුව පවතින පිටවීමේ සැලසුම් සකස් කර සැපයුම්කරු විසින් තම සේවකයින් සඳහා පිටවීමේ පුහුණුවීම් වසරකට වතාවක් සිදු කළ යුතුයි. ගිනි වැලැක්වීමේ උපකරණ තිබිය යුතු අතර සහ යන්ත්‍රොපකරණ සහ අනතුරු දායක මෙවලම් භාවිතා කරන්නන් සඳහා පුද්ගිලික ආරක්ෂක උපකරණ ලබාදිය යුතුයි. ගන්නා සෑම පියවරක්ම සැපයුම් කරු විසින් ලේඛන ගත කරගතයුතුයි.

මෙම සෞඛ්‍ය සහ ආරක්ෂක කටයුතු අධික්ෂණය කිරීම සඳහා සැපයුම් කරු විසින් ජේෂ්ඨ කළමණාකරන නියෝජිතයකු පත් කළ යුතුයි.

මෙම නියමිත කොන්දේසි විනෝද වෙන ස්ථාන සහ සේවකයින් නැවතී සිටින ස්ථාන සඳහාද අදාල වේ.

3.9 සමාගම් පැවැත්වීම සහ සාමුහ ගිවිසුම් සඳහා වූ නිදහස.

සේවකයින්ට වැඩ කිරීමේදී ගනුදෙනු කථාකිරීම විශේෂයෙන් වේතනයන් සහ නිදහස් කේවල් කිරීම් සඳහා සහ ඒ අයට සංවිධාන පිහිටුවීමට හා ඒවාට සම්බන්ධ වීමට ඒ අයගේ කැමැත්ත සහ කන්ඩායමක කැමැත්ත පරිදි ඉටු කිරීමට අයිතිය තිබිය යුතුයි. සේවකයින් මෙලෙස තනිව හෝ කණ්ඩායම් ලෙස සමාගම් වලට සම්බන්ධ වී කටයුතු කිරීමේදී සැපයුම්කරු ඒ අයට වෙනස් කොට නොසැලකිය යුතුයි. තවද විධාවට ලක්කිරීම තර්ජනය කිරීම පිළිගැනීම වූ නොකළ යුතුයි.

සේවකයින් සඳහා මැසිවිලි ඉදිරිපත් කිරීමට ක්‍රමවේදයක් තිබිය යුතුයි.

3.10 පාරිසරික ආරක්ෂාව

නිෂ්පාදනය සිදුකරන රටේ පරිසරික නීති රීති වලට අනුකූල වන ලෙස සැපයුම් කරු වැඩ කළ යුතුයි. විශේෂයෙන් කසල බැහැර කිරීමේදී අදාල වන ක්‍රියාමාර්ග සහ පුමිතීන් රසායනික ද්‍රව්‍ය සහ උපද්‍රවශීලි ද්‍රව්‍ය හසිරවීම සහ බැහැර කිරීම මෙන්ම විමචනය සහ අපජලය බැහැර කිරීම ව්‍යවස්ථාවට අනුව සිදුවිය යුතුය. සැපයුම් කරු පරිසරික දූෂණය අවම කිරීම වැලැක්වීමේ ක්‍රම නිරන්තරයෙන් අනුගමනය කළ යුතු අතර හැකිතාක් දුරට ඔහු ස්වාභාවික සම්පත් භාවිතා කළ යුතුයි.

4. **අධීක්ෂණය/ස්වයංතක්සේරුව සඳහා වූ අයිතිය.**

HUGO BOSS පෙර දැනුම් දීමකින් තොරව ඕනම වෙලාවක එනම් සමාන්‍ය ව්‍යාපාරික වේලාවන්හීදී එක් පුද්ගලයකු හෝ කිහිප දෙනකු හෝ HUGO BOSS නම් කරන ලද සංවිධානයක් මගින් සැපයුම් කරු හෝ ඔහුට අනුබද්ධ පුද්ගලයින්ට අධීක්ෂණයට ලක්කරයි. HUGO BOSS තම අභිමතය පරිදි එවැනි අධීක්ෂණයට තොරාගනු ලබයි. අධීක්ෂකවරුන් පැමිණි පසු තමන් HUGO BOSS යටතේ පැමිණි බවට සනාථ කළ යුතුයි. නීතියක් ලෙස එවැනි විගණනයක් කිරිමේදී HUGO BOSS විසින් වියදම් දැරිය යුතුයි. කෙසේ හෝ ව්‍යාපාර සබඳතා ඇතිකරගැනීමට පෙර සිදුකරන මූලික විසනනයන්හි වියදම් සැපයුම් කරු විසින් දැරිය යුතුයි.

විගණනයේ ප්‍රතිඵලයක් ලෙස සැපයුම්කරු විසින් වැඩිදියුණු කිරිාම් ක්‍රියාමාර්ග ඇතිකරලීමට ඉල්ලා සිටී.

විගණන වාර්ථාව අවධානම් හෝ ප්‍රමාණවත් නොවී නම් සැපයුම් කරු විසින් නැවත විසණනයක් සිදුකිරීම සඳහා වන වියදම් දැරිය යුතුයි.

HUGO BOSS ඉල්ලීම පරිදි සැපයුම් කරු විසින් නිසිපරිදි සම්පූර්ණ කරල ලද ස්වයංතක්සේරු ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කළ යුතුයි.

5. **සම්බාධක පැනවීම**

සම්බාධක පැනවීමේදී HUGO BOSS සැම විටම පුද්ගලික කරුණු සහ උල්ලංඝනය කිරීමේ බරපතල කම සලකා බලනු ඇත.

සැපයුම්කරු ඉහත සඳහන් නියමයන් එකක් හෝ උල්ලංගනයකර ඇති බවට HUGO BOSS වෙත දැණුනහොත් නීති උල්ලංගනය කල සැපයුම්කරුට ඒ බව දැනුම් දී නීතියට අනුව ඔහුට එය නිවැරදි කරගැනීමට කාලයක් ලබාදෙනු ඇත. උල්ලංඝනය කිරීම නිවාරදි කරගැනීමට ලබාදුන් කාලය ප්‍රමාණය නිවාරදි කරගැනීමේ ස්වභාවය මත තීරණය වේ. සැපයුම් කරුට ලබාදුන් කාලය තුල උල්ලංඝනය කිරීම නිවැරදි කර නොගතහොත් නම් HUGO BOSS කිසිදු දැනුම් දීමකින් තොරව වහාම ක්‍රියාවලිය සිදුකිරීම සඳහා ලබාදී තිබුන සියළුම දේ ඉවත් කරනු ලබයි.

5.1 ඊට අමතරව සැපයුම් කරු දිගින් දිගටම මෙම නීති උල්ලංගණය කරයි නම් HUGO BOSS විසින් ඔහු සමඟ ඇති සබඳතාවය අත්හිටුවයි. සුලබ උල්ලංඝනය වීම් ලෙස ළමා කම්කරු සේවය. හෝ බලහත්කාරයෙන් වැඩ ගැනීම සහ 4 වන කොටසේ 1 වන ඡේදයට අනුව අධීක්ෂණයට පිටුපෑම ලෙස සැලකේ.

තවද උල්ලංඝනය වීම් නිසා සිදුවන අලාභහානි සඳහා HUGO BOSS විසින් සැපයුම් කරුවන්ගෙන් වන්දි ලබාගනු ඇත.